Page 10 Aug-Sep 2012.qxd 24/09/2012 14:54 Page 1



# 1948 ප්‍රථම නිදහස් උත්සවය බැලූ - බුලු

## එක්සත් රාජධානියේ වාසය කළ පැරණිම ශ්‍රීලාංකිකයා අභාවප්‍රාප්ත වෙයි



තරුණ බුලූවල



බුලූවල යුවළ තම මුනුපුරා සමග 1998 දී

අවුරුදු 64 කට පෙර බ්‍රිතාන්‍ය පාලනයෙන් ලංකාවට නිදහස ලැබුණු විට ඒ සඳහා පැවැත්වූ ප්‍රථම නිදහස් උත්සවය දුටු කෙනෙකු හමුවිය හැක්කේ ඉතා කලාතුරකිනි. වසර හැටහතරකට පෙර ශ්‍රීලංකාවේ සිට එංගලන්තයට පැමිණ, තවම ජීවත්වන ලාංකිකයෙකු දකින්නටද බැරිය. එහෙත් එවැනි කෙනෙකු, එසේම මේතාක් සිය මව්රටට අප්‍රමාණ සෙනෙහස දක්වමින් ලන්ඩනයේ ජීවත් වූ සිංහලයෙකු ගැන මම දැන සිටියෙමි. ඒ සිංහළයා හරියටම මාසයකට පෙර ගිය අගෝස්තු 12 වනදා අභාවප්‍රාප්ත වූයේය. ඔහු නමින් ඩී. පී. බුලූවල ය.

රසවත් නවකතාවක පමණක් දක්නා අන්දමේ විචිත්‍රතාවක් බුලූවල මහතාගේ ජීවන ප්‍රවෘත්තීන්හි ගැබ්ව තිබේ. චමත්කාරයෙන් අනූන ඒ සෑම සිද්ධියක්ම අප රටේ එවක පාලන තන්ත්‍රයේ ස්වරූපය කෙබඳුදැයි පෙන්වන කැඩ පතක් වැනිය. ලංකාවේදී අපේ ප්‍රථම අගමැති ඩී. ඇස්. සේනානායක මහතාද, සර් ජෝන් කොතලා වල මහතාද ඉතා සමීපව ඇසුරු කිරීමේ වාසනාව ලද ඔහු ඒ දෙදෙනගේ ඉතාම හිතේසි වන්ත ආරක්ෂකයා ද විය. ඔවුන් ඔහු ඇඳින්වූයේ බුලූ හෝ පොඩි ඕවර් සියර් යනුවෙනි. බුලූ ලන්ඩනයට ඒ මට ලංකාවෙන් පිටත්වුණේ 1948 අපේ පළමු නිදහස් උත්සවයට දින හතරකට පසුවය. ඒ ගමන පිළියෙල වූ හැටි ද අසා සිටින්නට රසවත්ය.

ලංකාවට ළඟදීම නිදහස ලැබෙන බවට එකල රට පුරාම පැතිරුණු ආරංචියෙන් අප රටේ ජනතාව කුල්මත්ව සිටි අවධියකි ඒ. එකල දැන් මෙන් ශ්‍රීලංකා තානාපති කාර්‍යාලයක් එංගලන්තයේ නොවීය. එහෙත් ලංකාව වෙනුවෙන් ට්‍රැපල්ගා චතුරශ්‍රය අසල **Dominion of Ceylon** නමැති තැනක් තිබුණි. නිදහස ලැබුණු පසු ලන්ඩනයේ ලංකාව නියෝජනය කරන්නට නියම කාර්‍යාලයක් අරින්නට කටයුතු පිළියෙල කළ සේනානායක මහතා ඒ ස්ථානයේ පාලක (Caretaker) ලෙස තම ඉතාම විස්වාසවන්තයා එවන්නට හිතාගෙන මෙසේ කීවේය.

ලන්ඩන් වල අපේ ලංකා ඔපීසියක් අපි අරිනවා. ඒක බලාගන්න මම පොඩි ඕවර්සියර් යවනවා. ලෑස්ති වෙන්න ලන්ඩන් යන්න.

බුලූ අන්දුන් කුන්දුන් වීය. ලන්ඩන් එන්නට ඔහු කිසිදා හිතා හිටියේ නැත. මහා නිදහස් උළෙලක් පැවැත්වෙන්නට යන බව පැතිරී තිබුණි තව ඇත්තේ දින කීපයකි. ලන්ඩන් ගියොත් එය බලන්න ලැබෙන්නේ නැත.

"මහත්තෙයො මම උත්සවේ බලලම යන්නද?" ඔහු සේනානායක මහතාගෙන් ඇසී ය.

"හා හොඳයි. එහෙනම් උත්සවේට පහුවෙන්දම නැව්නගින්න ඕන......"

**1948** පෙබරවාරි **10** වෙනි දින කොළඹ නිදහස් චතුරශ්‍රයේදී ග්ලොස්ටර්හි ආදිපාද-වරයා ප්‍රධාන බ්‍රිතාන්‍ය සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් අත්‍යාලංකාර ලෙස ශ්‍රීලංකාවේ ප්‍රථම නිදහස් උත්සවය පැවැත්විණ. කොළඹ පමණක් නොව මුළු මහත් ලංකාවම එකම මඟුල් ගෙයක් වීය. නිදහස් චතුරශ්‍රය අවට ලක්ෂ සංඛ්‍යාත ජනී ජනයාගෙන් පිරීගොස් එකම හිස්ගොඩක් බවට පත්විණ. නිදහස් චතුරශ්‍ර මණ්ඩපයේ කොණක සිට උත්සවය නරඹන්නට බුළුවල මහතාට හැකිවිය. ඊට දින දෙකකට පසු ඔහු එංගලන්තය බලා නැව් නැංගේය.

එදා සිට ඔහු මේ දක්වාම ලන්ඩනයේ ජීවත්වූයේය. ට්‍රැපල්ගා චතුරශ්‍රය අසළ වූ Dominion of Ceylon දැන් ඇමරිකානු තානාපති කාර්යාලය ඇති තැනට ගෙනයන ලදී. එතැනින් අද දවසේ හයිඩ්පාක් ගාඩන්ස්හි ශ්‍රීලංකා මහ කොමසාරිස් කාර්‍යාලය දක්වා එහි ආරක්ෂකයා ලෙස, වසර කීපයකට පෙර විශ්‍රාම යනතුරු බුළුවල මහතා සේවය කළේය. ඔහුගේ සේවා කාලය තුළ ලංකා මහ කොමසාරිස්වරු **17** දෙනෙකු වරින්වර ලන්ඩනයේ සේවයේ යෙදී ඇත.

1958 දී බුලූ ලංකාවට ගොස් තම නෑනා සමග විවාහ වී ඇයද කැටුව පැමිණියේය. ඔවුන්ගේ විවාහයට අත්සන් තැබූයේ අගමැති සර් ජෝන් කොතලාවල මහතා ය. බුලූවල යුවළට පුතුන් දෙදෙනෙක් හා දුවක් සිටිති. වෛද්‍යවරයෙකු වන ලොකුපුතා ලන්ඩනයේ සුප්‍රකට වෛද්‍ය පීඨයක් වන ඉම්පීරියල් කොලේජ් හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු ලෙස සේවය කරයි.

බුලූවල මහතා ගැන කිවහැකි බොහෝ දේ අතර වඩා වැදගත්ම දෙය නම් වසර හැටහතරක් පුරා එංගලන්තයේ ජීවත් වුවද ඔහු මියෙන මොහොත දක්වා හොඳ පිරිසිදු සිංහළ කතාකිරීමයි සිංහළ පුවත්පත් කියවීමයි.. එංගලන්තයට පැමිණ අවුරුදු දෙකෙන් තුනෙන් සිංහළ අමතක කරන ඉංග්‍රීසි කළවම් කර සිංහළ කතාකරන බොහෝ පුස්සන් වෙසෙන සිංහළ සමාජයේ සැබැවින්ම බුලූවල යනු ඇඳහිය යුතු කෙනෙකි. ඔවුන්ගේ සැබෑ සිංහළකම කුමකින් අගේ කළ හැකිද?

මේ ආදර්ශමත් සිංහළයාට උතුම් වූ නිවන් සුව ප්‍රාර්ථනා කරමු !

♦ දයා ආනන්ද







# යුද්ධය ඉවරයි ! දැන් රණවිරුවන්ට ගහන කාලයයි මේ !

මේ ඉහත පින්තූරයේ දකුණු පැත්තේ හිසට බෙහෙත් පැලැස්තර අලවා සිටින්නේ ශ්‍රීලංකා යුද හමුදාවේ බුද්ධි අංශයේ චන්දන ප්‍රදීප් නමැති මේජර්. වම් පැත්තෙන් දිව ඇදගෙන ඉන්නේ වත්මන් ලංකා රජයේ මහජන සම්බන්ධතා ඇමති මර්වින් සිල්වාගේ අසික්කිත පුත්‍රයා වන මාලක සිල්වා. මෙතන වෙලා තිබෙන සිද්ධිය ලංකාවෙ ප්‍රධාන පුවත් පත්වල සහ වෙබ් අඩවි වල පළවෙලා තිබුණු විදියටයි මේ ඉදිරිපත් කරන්නේ.

මහජන සම්බන්ධතා ඇමති මර්වින් සිල්වාගේ පුතා වන මාලක සිල්වා සහ මනෝ විරේරත්නගේ පුතා ද ඇතුළු පිරිසක් කොළඹ ජායික් හිල්ටන් හෝටල් ගොඩනැගිල්ලේ කාර් පාක් එකෙහි දී යුද හමුදා බුද්ධි බලකායේ මේජර්වරයෙකුට හා ඔහුගේ සහායක කෝප්රල් වරයෙකුට පහරදී මේජර්ගේ ගිනි අවිය සහ මොබයිල් දුර කථනය ද පැහැරගෙන කරේ තිබූ රත්රන් මාලයද කඩාගෙන ගිය බව කියති.

මාලක සිල්වා ඇතුළු පිරිස මේජර් වටකොට පහර දෙනු එම ගොඩනැගිල්ලේ සවිකර ඇති CCTV කැමරාවලද සටහන්ව ඇත. පහරදීමට ලක්වූ මේජර් වරයා සහ ඔහුගේ සහායකයා කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයේ ප්‍රතිකාර ලබති. මේජර්වරයා සිද්ධිය කොම්පඤ්ඤවීදිය පොලීසියට පැමිණිළි කළද පොලීසිය කියන්නේ තවම සැක කරුවන් අත් අඩංගුවට ගන්නට නොහැකිව ඇති බවයි.

මෙම පහරදීමට හේතුවූ මූලික කාරණාව සඳහන් වෙන්නේ මෙහෙමයි. මාලක සිල්වා සහ මනෝ විජේරත්නගේ පුතා ඇතුළු කීප දෙනෙක් කාර්පාක් එකේදී මේජර් ප්‍රදීප්ගෙන් සිගරට් එකක් ඉල්ලලා තියෙනවා. මේජර් සිගරට් එකක් දීලා. ඊළඟට ගින්දර ඉල්ලලා තියනවා. ගින්දර නැහැයි කිව්වම ගින්දර නැත්නම් සිගරට් මොකටද යකෝ? කියලා මාලකයි අනික් සගයයි මේජර්ටයි ඔහුගෙ සහායක කෝප්රල්ටයි හොඳටම ගහලා. ඒ ගහන අතරේ මේජර්ගෙ මොබයිල් ෆෝන් එකයි, රිවෝල්වර් එකයි උදුරගෙන. කරේ තිබුණු රත්තරන් මාලෙත් කඩාගෙන. උන් ගියා යන්න. මේජර් සහ කෝප්රල් රෝහලට අරන් ගිහින් සැත්කමකුත් කරන්න වෙලා.

ඊට දවස් දෙකකට පස්සෙ මාලක ගියයි කියන කාර් එකේ රියැදුරා කොම්පඤ්ඤවීදියෙ පොලීසියට ඇවිල්ලා රිවෝල්වර යයි මොබයිල් ෆෝන් එකයි පොලීසියට බාරදීලා තියනවා කාර් එකේ වැටිලා තිබුණයි කියලා.

පොලීසිය කියනවා තමයි සැකකරුවො අල්ල ගන්න බැරි වුනයි කියලා. කැළණියෙ මිනිස්සු කියනවා ඔය ඉන්නෙ මාලක සිල්වා හැම තැනම. අල්ලනව නම් මොකෝ අල්ලන්න බැරි? කියලා. ඒ වුනාට කවුරුත් දන්නවා අල්ලන්නෙ නෑ කියලා.

මැති ඇමතිවරුන්ගෙ පුත්තු පිස්සු කෙළින්නේ දැන් බොහොම කාලෙක ඉඳලා. ඒක එවුන්ගෙ අයිතියක් වෙලා. මේ පේඩ් කොල්ලන්ට පොලීසියත් බයයි. යුද්ධය යන කාලෙදි රණවිරුවන්ට පෙන්නපු ගෞරවය දැන් කෝ? යුද්ධය ඉවරයි නේ දැන් හදන්නෙ රණවිරුවන්ට අහුවෙච්ච තැන ගහන්න.

රජය කියනවා ආසියාවෙ ආශ්චර්යය කරනවයි කියලා ලංකාව. ආශ්චර්යය කොහොම වෙතත් රජය තමන්ගෙම ලකුණු කපාගන්න හැටි පේනවා. පිරිහීමෙ දොරටුව පැත්තට ටිකෙන් ටික හැරෙන හැටි පේනවා. ජනතාවගෙ විශ්වාසය නැතිවුනොත් බිඳුනොත් ඒක ආපහු හදා ගන්න බෑ. ලෝකෙම හතුරො හැදීගෙන එන කාලෙක ගෙදරත් හතුරො හදාගත්තොත් වෙන්නෙ මොකද?

♦ වෙලේගෙදර රාළ London

## සාදර සිහිකිරීමයි !

# චාර්ල්ස් සීත් මහතා (චාලි) ලන්ඩන් විහාරය

ලන්ඩන් බෞද්ධ විහාරයට ගිය බොහෝ දෙනෙකුට දැන් වසර ගණනක් තිස්සේ නිතර දක්නට ලැබුණු හමුවුණු ඉංග්‍රීසි ජාතික බෞද්ධයෙක් සිටියා. ඔහුගේ සම්පූර්ණ නම චාර්ල්ස් සීත්. ලන්ඩන් විහාරයේ ස්වාමීන් වහන්සේලාත් එහි යන සැදැහැවතුනුත් කවුරුත් ඔහු හැඳින් වූයේ චාලි යන කෙටි නාමයෙන්.

චාලිත් ලන්ඩන් විහාරයත් දෙකක් නොව එකක් වන තරමට විහාරයට ඔහු දැක්වූ භක්තිය හා ඇල්ම ඔහු කරන වතාවත් දකින විට ක්ෂණිකව වැටහෙන දෙයක්. නිකම් සිටින වෙලාවක් දකින්න බැරි තරම් හැම විටම ඔහු විහාරයට සම්බන්ධ වැඩක යෙදී ඉන්නවා අප දකිනව. විහාරවාසී ස්වාමීන් වහන්සේලා සියලු දෙනාම පිරිතකට හෝ දානෙකට වැඩියොත් විහාරය බලාගන්නෙ චාලි.

ඒ කටයුතු කරන අතරෙම චාලි විහාර ගෙයි වැඳුම් පිදුම් කරනවා භාවනා කරනවාත් අප දැක තිබෙනවා. ඔහු ඉතා භක්තිමත් බෞද්ධයෙක්.

හදිසියේ අපට දැනගන්නට ලැබුණා ඔහු අසනීපව රෝහලක නවතා සිටින බව. බොහෝ දෙනෙක් දැනගෙන හිටියෙ නැහැ ඔහුගේ රෝගය දිනෙන් දින අසාධ්‍ය තත්වයට හැරුණා. ඔහු ඉක්මනින්ම මෙලොව හැරගියා.



Mr Charles Seath (Charlie)

චාලිගේ අවමංගල්‍යය ලන්ඩන් විහාරයේ මූලිකත්වයෙන් බොහෝ පිරිසකගේ සහභාගිත්වයෙන් පසුගිය මාසෙ සිද්ධ වුණා. දැන් ඔහු අප අතර නැතත් ඔහුගේ ප්‍රසන්න පෙනුම සිනාව සහ කාරුණික මෘදු වදන් තවමත් අපට මතක්වෙනවා.

**චාර්ල්ස් සීත් මහතාට නිවන් සැප ලැබේවා !**

**May he attain Nibbana !**

# මුන්නේස්වරම් කෝවිලේ සත්ව බිලි පූජාවට එරෙහි පෙත්සම ඉවතට විසිවෙයි!

හලාවත මුන්නේස්වරම් කෝවිලේ භද්‍රකාලී පුදන බැතිමතුන් වෙනුවෙන් වාර්ෂිකව දහස් ගණනක් එලුවන් හා කුකුළන් ගෙනැවිත් බෙලිකපා කරන වනචාරී බිලිපූජාව නවතා දමන ලෙස එම කෝවිලේ පූසාරීන්ට එරෙහිව ගොනුකර තිබූ පෙත්සම ගිය සතියේ හලාවත දිස්ත්‍රික් විනිසුරු විසින් ඉවත දමන ලදී. බිලි පූජාවක් තහනම් කිරීමට උසාවි නීති පද්ධතියේ කිසිදු වගන්තියක් නැති බව ඔහු කියා ඇත. කෙසේ නමුත් සතුන් ලොරිවල පටවා ගෙනෙන විට පොලීසියට අවශ්‍ය නම් උන් අත් අඩංගුවට ගන්නට හැකි බවද විනිසුරුවරයා කියා තිබේ

පිරිසිදු ථෙරවාද බුදු දහම ඇති ශ්‍රීලංකාව වැනි රටක දහස් ගණන් සතුන්ගේ බෙලිකපා දමමින් කරන අමානුෂික ක්‍රියාව බුදු දහමට කොහෙත්ම ගැළපෙන්නේ නැතැයි දැන් කාලයක් තිස්සේ භික්ෂූන් වහන්සේලා ඇතුළු සත්ව අවිහිංසා ව්‍යාපාර හඬ නගගත් ඒ බිලි පූජාව නොනවත්වා සිදුවන්නේය. රජය හෝ මැති ඇමතිවරුන් පියවරක් නොගන්නේ දේශපාලන වශයෙන් ඔවුන්ට අවාසි වේයයි සිතන නිසාය. එහෙත් බෞද්ධ රටක්ය කියමි-න් සත්ව ඝාතනයට ඉඩ දෙනවා නම් එතැන සිදුවන්නේ තනිකරම ප්‍රෝඩාවක් බව තේරුම් ගන්නට කෙනෙකුට අපහසු නැත!